# පිළිතුරු පත්‍රය

## I කොටස

01 බුදුරජාණන් වහන්සේ 02 විදුහල්පති තුමා 03 සවන්දීම, සමානාත්මතාව, ස්ථිරසාර බව

04 පාලන නායකයින් / ප්‍රජාතන්ත්‍රවාදී නායකයින් / නිදහස් නායකයින්

05 මාර්ටින් ලූතර් කිං

06 ශ්‍රීමත් පොන්නම්බලම් රාමනාදන්, පොන්නම්බලම් අරුණාචලම්, සිද්දි ලෙබ්බේ

07 ✓ 08 ✗ 09 ✓ 10 ✗ 11 ✓ 12 ✗

13 18 හා 19 වන සියවස්වල

14 වෘත්තීය පුහුණු අධිකාරිය / ජාතික ආධුනිකත්ව මණ්ඩලය

15 අධ්‍යාපනය, සෞඛ්‍යය, විදුලිය, දුරකථන

16 මාර්ග නඩත්තුව, අලුත්වැඩියාව, අධිවේගී මාර්ග ඉදිකිරීම

17 අන්තර් පුද්ගල සබඳතා වර්ධනය කිරීම / රටේ පරිපාලන කටයුතු පහසුකර ගැනීම

18 දුරකථනය / ෆැක්ස් යන්ත්‍රය / චන්ද්‍රිකා

19 ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය / ශ්‍රී ලංකා දුම්රිය සේවය

20 රෝගීන්ට නිසි ප්‍රතිකාර සැපයීම / බෝවන රෝග වැළැක්වීම

## II කොටස

01 (1) සාමූහික ක්‍රියාකාරකම් මගින් කණ්ඩායම් අරමුණු ඉටුකර ගැනීම සඳහා කණ්ඩායම මෙහෙයවීම නායකත්වය වේ.

(2) ග්‍රාම නිලධාරී මහතා, දේශපාලන නායකයින්, පන්සලේ හාමුදුරුවෝ, සෘද්ධි නිලධාරී මහතා, පවුල් සෞඛ්‍ය සේවිකාව, ප්‍රජා සමිතිවල නිලධාරීන්

(3) බුදුන් වහන්සේ / මහත්මා ගාන්ධි ඔවුන් කළ සේවය හා නායකත්ව ගුණාංග ඇත්නම් ලකුණු ලබාදෙන්න.

02 (1) සැලසුම් කිරීම / ස්ථිරසාර බව / සවන්දීම / සමානාත්මතාව / මිත්‍රශීලී බව

(2) පාලන නායකයින් / ප්‍රජාතන්ත්‍රවාදී නායකයින් / නිදහස් නායකයින්

(3) පාලන නායකයින් - පාලකයා තීරණ ගනු ලබන අතර, ඒවා කණ්ඩායම් නායකයින් ක්‍රියාත්මක කරයි. අනුගාමිකයින් නොසලකා ඇත.

ප්‍රජාතන්ත්‍රවාදී නායකයින් - කණ්ඩායමේ සාමාජිකයින්ට තීරණ ගැනීමට අවස්ථාව සලසා දෙයි. සාමූහිකව ක්‍රියා කරයි.

නිදහස් නායකයින් - සාමාජිකයින්ට ස්වාධීනව කටයුතු කළ හැකිය.

03 (1) ජීවත්වීම සඳහා ප්‍රමාණවත් ආදායමක් ලැබීම / මූලික අවශ්‍යතා සපුරාලීම / යටිතල පහසුකම් සංවර්ධනය / ජනතාවගේ ජීවන මට්ටම උසස් කිරීම / ආරක්ෂාව තහවුරු කිරීම

(2) ''රන් දහදිය බිංදු බිංදු - ඉසුරු සුවඳ රැන්දු රැන්දු....'' ඩබ්. ඩී. අමරදේව

(3) වැඩ ලෝකයේ දී අපට හමුවන ඇතැම් කාර්යයන් ඉටුකිරීම සඳහා විශේෂයෙන් පුහුණු කරන ලද ශ්‍රමය අත්‍යවශ්‍ය වේ. මෙය පුහුණු ශ්‍රමිකයෙකු අත්පත් කර ගන්නා විශේෂ ප්‍රාගුණ්‍යය වේ. (උදා - ගුවන් නියමුවෙකු ගුවන් යානයක් පැදවීම, රෝගියෙකුට ශල්‍යකර්මයක් කිරීම)

04 (1) සමාජයේ ජීවත්වන සියලු දෙනාගේ ම ජීවන තත්ත්වය යහපත් කිරීමේ අරමුණු ඇතිව රජය, පළාත් පාලන ආයතන හා ස්වේච්ඡා සංවිධාන මගින් පොදුවේ සපයනු ලබන සේවා පොදු සේවා ලෙස හැඳින්වීමට පිළිවන

(2) මූලික අවශ්‍යතා ඉටුකිරීමට දායක වීම / සියලු දෙනාටම පොදුවේ ලබාගත හැකි වීම / සෑම පුරවැසියෙකුටම පහසුවෙන් ලබාගතහැකි වීම / ලාභ ඉපයීමට වඩා මහජන සුභ සිද්ධිය අරමුණු කරගෙන පවත්වාගෙන යාම / අඩු ආදායම්ලාභීන්ට විශේෂයෙන් සහනදායී වීම

(3) ජලය / විදුලිය / සෞඛ්‍යය / අධ්‍යාපනය / ප්‍රවාහනය / පණිවිඩ හුවමාරු සේවා මේ එකක් පිළිබඳව විස්තර කර ඇත්නම් උපරිම ලකුණු ලබාදෙන්න.

05 (1) ගැටුමක් වනාහී යම් පුද්ගලයෙක් හෝ පුද්ගල කණ්ඩායමක් තමන්ට ලබාගත යුතු යැයි සිතන දෙයක් ලබාගැනීම සඳහා අනෙකා හෝ අන් සියලු දේ පරාජය කළ යුතු යැයි සිතීම නිසා ඇතිවන තත්ත්වයකි.

(2) වැරදි වැටහීමක් ඇතිවීම / වංචනික සිද්ධියක් ඇතිවීම / හිමිකමක් අහිමි වීම / වැරදි තීරණයක් ගැනීම / අයිතිවාසිකමක් නොලැබීම

(3) නිවැරදි තීරණ ගැනීම හා ඒවා ක්‍රියාත්මක කිරීම / කරුණු හරිහැටි තේරුම් ගැනීම / විවෘත අදහස් හුවමාරු කර ගැනීම / හේතු සහගතව කරුණු ඉදිරිපත් කිරීම / අනෙක් පාර්ශවයට ඇහුම්කන් දීම / අන්‍යෝන්‍ය ගෞරවය රැකගැනීම / සහයෝගයෙන් ක්‍රියා කිරීම.